**අම්බලන්තොට ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාචනය

අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම වන 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ නොකරමි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මතය ව්‍යාචනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් ඉදිකර තිබූ ගොඩනැගිලි 03 ක එකතු වටිනාකම වූ රු.5,053,339 ක් හා රු.74,250 ක කාර්යාල උපකරණ හා මෙවලම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයන්ට සහ සමාලෝචිත වර්ෂයට අදාළව කඩ කාමර බදු දීමෙන් ලද එක්වන් මුදල් රු.1,963,500 ක් ආදායමට නොගෙන මිශ්‍ර තැන්පත් සහ ටෙන්ඩර් තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබුණි. | එක්වන් මුදල් සභා ආදායමට ගැනීමට කටයුතු කරන බව. | එක්වන් මුදල් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ස්ථිර කාර්යය මණ්ඩලය සඳහා ගෙවන ලද වැටුප්, මන්ත්‍රී දීමනා හා සේවක ණය පොලී අඩුවෙන් ප්‍රතිපූර්ණය වූ රු.997,934 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස හා වැඩියෙන් ප්‍රතිපූර්ණය වූ රු.260,701 ක් ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | බිල්කළ යුතු උසාවි දඩ ආදායම රු.622,442 ක් හා ණයගිම් ප්‍රතිපාදන වෙන්කිරීම රු.360,701 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් හා ණයගිම් ප්‍රතිපාදන නිවැරදිව ගිණුම්ගත කිරීම හා වෙන් කිරීම් කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂයේදී මිලදී ගත් එකතු වටිනාකම රු.331,180 ක් වූ ජල ටැංකි ආධාරක 04 ක් ලී බඩු හා සවිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | පරිත්‍යාග නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | කර්මාන්ත තුනකට අදාළ ප්‍රාග්ධන ලැබීම්වල එකතු වටිනාකම රු.295,263 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රාග්ධන ලැබීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | අම්බලන්තොට වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 කින් ලැබිය යුතු එක්වන් මුදල් රු.150,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | ගබඩා තොග ශේෂය තුළ පැවති තොග අයිතම 05 ක එකතු වටිනාකම රු.152,169 ක් අඩුවෙන් හා තොග අයිතම 03 ක එකතු වටිනාකම රු.17,382 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හඳුනා නොගත් බැර ශේෂය රු.181,875 ක් විය. | වෙනස හඳුනා ගැනීමට කටයුතු කරන බව | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 02 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.156,181 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් වලට හේතු හඳුනා ගනිමින් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු.160,321,537 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඇතැම් ශේෂ සඳහා ලේඛන හෝ උපලේඛන නොමැති බවත්, විස්තර සොයාගතහැකි ශේෂවල තොරතුරු ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වන වගන්තිය | 2011 වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකිරීම නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය අවුරුදු 07 ක් විය. | තක්සේරු වාර්තාව ලැබුණු පසු වරිපනම් බදු අයකිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 102 හා 104 | වටිනාකම රු.28,488 ක් වූ යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ඉන්වෙන්ට්‍රිගත අයිතම, අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අස්ථානගත වී ඇති භාණ්ඩ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදු කිරීමට අභ්‍යන්තර විගණක දැනුවත් කර ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 ජූලි 11 දිනැති අංක 14/2022(III) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවේ නිලධාරියෙකු විදේශ නිවාඩු අනුමතකර නොගෙන 2023 අගෝස්තු 01 දින සිට විදේශගත වී තිබුණද නිවාඩු අනුමත කර ගැනීමට විගණිත දිනය වූ 2024 පෙබරවාරි 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | නිවාඩු අයදුම් පත්‍රවල අඩුපාඩු නිවැරදි කර ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් දන්වා ඇති බව | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,443,340 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.7,363,800 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 5,310,000 | 5,940,312 | 6,627,668 | 3,170,102 | 5,581,000 | 5,377,655 | 6,696,803 | 3,857,460 |
| කුලී | 15,432,000 | 12,575,167 | 16,164,732 | 5,159,267 | 254,271,000 | 12,493,686 | 14,023,430 | 8,748,833 |
| බලපත්‍ර ගාස්තු | 2,647,000 | 3,685,863 | 3,978,259 | 467,850 | 2,778,000 | 2,023,292 | 2,448,562 | 760,245 |
| වෙනත් ආදායම් | 12,896,000 | 14,561,420 | 14,503,543 | 607,790 | 18,543,000 | 8,486,845 | 8,552,093 | 549,911 |
| **එකතුව** | **36,285,000** | **36,762,762** | **41,274,202** | **9,405,009** | **281,173,000** | **28,381,478** | **31,720,888** | **13,916,449** |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු වරිපනම් බදු රු.2,800,752 ක් හා කඩ කාමර 96 කින් ලැබිය යුතු කඩ කුලී රු.1,018,042 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ පිළිවෙළින් 158(1) හා 159(1) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු රු.252,086 ක් හා කඩ කුලී රු.515,488 ක් අයකර ගෙන ඇති අතර, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපාර ඒකක 162 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු රු.369,350 ක් 2022 නොවැම්බර් 25 දිනැති අංක 2308 දරණ ගැසට් නිවේදනය පරිදි 2023 මාර්තු 31 දිනට ප්‍රථමව අයකළ යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. | ඒකක 09 ක් සඳහා නඩු කටයුතු සිදුකරන අතර ඒකක 153 ක් උසාවියට ගෙවීම් කර ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | වාර්ෂිකව බදුදෙන දේපළ 05 කින් ලැබිය යුතු බදු කුලී රු.1,027,975 ක් හා ඉකුත් වර්ෂයන්ට අදාළව ටෙන්ඩර් බදු නඩු පැවරීම් වෙනුවෙන් ලැබිය යුතු රු.1,427,941 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර සභාව සතු බදු දිය හැකි දේපල 10 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බදු දී නොතිබුණි. | රු.219,234 ක් අයකර ගෙන ඇති අතර බරවකුඹුක සති පොලෙන් ලැබිය යුතු රු.808,741 ක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | සභාව සතු වාහන හා උපකරණ කුලියට දීමෙන් හා ජංගම අත්කරත්ත වෙනුවෙන් ලැබිය යුතු කුලී පිළිවෙලින් රු.1,617,259 ක් හා රු.68,050 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වාහන කුලී වටිනාකමින් රු.76,020 ක් සඳහා පමණක් තොරතුරු සභාව සතුව ඇති අතර එම මුදල් ගෙවන ලෙස දැනුවත් කළ බවත්, කුලී නොගෙවන ජංගම අත්කරත්ත සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් නොවූ දැන්වීම් පුවරු 22 වූ අතර ඉන් ලැබිය යුතු ගාස්තුව රු.195,500 ක් වූයෙන් සභාවේ ආදායම් පරීක්ෂකවරු තම රාජකාරිමය වගකීම් නිසි පරිදි ඉටුකර නොතිබූ බවත්, සමීක්ෂණ කටයුතු වෙනුවෙන් දරන ලද වියදම නිෂ්කාර්යය වියදමක් බවට නිරීක්ෂණය කෙරේ. | 2024 වර්ෂයේ මෙම වරද නිවැරදි කර ගාස්තු අයකිරීමට කටයුතු කරන බව. | වාර්ෂිකව සමීක්ෂණය නිවැරදිව සිදුකර ගාස්තු අයකරගත යුතුය. |
| (ඊ) | දැන්වීම් පුවරු 50 ක් වෙනුවෙන් ලැබිය යුතු ගාස්තු රු.428,100 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඒකක 21 කින් රු.157,800 ක් අයවී ඇති බවත්, ඒකක 29 ක් සඳහා නීතිමය කටයුතු සිදුකරමින් පවතින බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.3,427,813 ක් හා රු.24,573,692 ක් විය. | 2022 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ලද බවත්, ඉතිරි හිඟ ගෙන්වා ගැනීමට කටයුතු කරන බව | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වීථි පහන් පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ඒවා අංකනය කර ලේඛනගත කිරීම විගණිත දිනය වූ 2024 පෙබරවාරි 16 දින වන විටත් අවසන් කර නොතිබූ අතර සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 55 කින් 07 ක පමණක් සංගණන කටයුතු අවසන් කර තිබුණි. | මේ වන විට ඉතිරි වසම්වල සංගණන කටයුතු ආරම්භ කර ඇති බව. | සංගණන කටයුතු නිවැරදිව සිදුකර නඩත්තු වියදම් දැරීම සිදුකළ යුතුය. |
| (ආ) | විදුලි බල්බ සවිකරනු ලබන ප්‍රදේශය සහ ස්ථානය අනුව විදුලි බල්බ මිලදී ගෙන සවිකිරීමට කටයුතු නොකර සියලුම ස්ථානවල සවිකිරීම සඳහා වටිනාකම රු.1,490,000 ක් වූ වොට් 18 ප්‍රමාණයේ LED විදුලි බල්බ මිලදී ගෙන තිබුණි. | විදුලි බල්බ සවිකරන ස්ථාන හා ප්‍රදේශය අනුව බල්බ මිලදී ගෙන සවි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අවශ්‍යතාවය හඳුනාගෙන බල්බ මිලදී ගෙන සවිකළ යුතුය. |
| (ඇ) | සභාව සතු වාහන සහ යන්ත්‍රෝපකරණ 07 කින් 2023 වර්ෂයේ ලද ආදායම රු.1,095,550 ක් වුවද ඒවා සඳහා ඉන්ධන පිරිවැය රු.5,661,025 ක් වූයෙන් වර්ෂය තුළ දරන ලද ඉන්ධන වියදම ආවරණය කර ගැනීමට හැකිවන පරිදි ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහජන අවශ්‍යතා ඉටු කිරීමට නොමිලේ සේවා සැපයීමට සිදුවීම වියදම් ඉහළ යාමට හේතුවූ බව. | වියදම් ආවරණය වන පරිදි ආදායම් උත්පාදනය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අනුමත ගොඩනැගිලි සැලසුම් 04 කට අදාළව ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු, වලංගු කාලය දීර්ඝ කිරීමේ ගාස්තු සහ අනුකූලතා සහතික ගාස්තු ලෙස රු.649,568 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සංශෝධිත සැලසුම් ඉදිරිපත් කර අනුමත කර ගන්නා ලෙසත්, නියමිත ගාස්තු ගෙවීමට කටයුතු කරන ලෙසත් අයදුම්කරුවන් දැනුවත් කළ බව | නියමිත ගාස්තු අයකර සංශෝධිත සැලසුම් අනුමත කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට විවිධ රාජ්‍ය ආයතනවලින් සභාව වෙත ප්‍රදානය කර ඇති විගණිත දින වන විටත් සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණු වාහන හා යන්ත්‍රෝපකරණ 07 ක සහ ඉඩම් හා ගොඩනැගිලි 143 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලොචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | යන්ත්‍රෝපකරණ හා ඉඩම් ගොඩනැගිලි පවරා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන සකස් කර යවා ඇති බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සැලැස්ම තුළ සභා බල ප්‍රදේශයේ මාර්ග හා කාණු සංවර්ධනය කිරීම සඳහා රු.3,200,000 ක් වාර්ෂික අයවැය ලේඛනය මගින් වෙන්කර ගෙන තිබුණද, එම සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට සහා කළමනාකාරීත්වය වර්ෂය තුළදී කටයුතු කර නොතිබීමෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන උපක්‍රමයක් ලෙස භාවිතාකර නොතිබුණි. | 2023 වර්ෂයේ අපේක්ෂා කළ ආදායම් නොලැබීම හේතුවෙන් මෙම කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ බව. | අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 වගන්තිය ප්‍රකාරව නිශ්චිත පිරිවිතර නොදක්වා එකතු වටිනාකම රු.929,700 ක් වූ ටයර් හා ටියුබ් මිලදී ගෙන තිබුණි. | ඉදිරියේදී නියමිත පිරිවිතර සඳහන් කර මිලදී ගැනීම් සිදුකරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) වගන්තිය අනුව යම්කිසි පුද්ගලයෙක් ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන දෙකෙහිම සාමාජිකයෙකු නොවිය යුතු වුවත්, තාක්ෂණ සේවා නිලධාරී සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත්කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවන පරිදි මිලදී ගැනීම් සිදු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බරවකුඹුක සිට මාමඩල දක්වා ජලනල එළීමේ ව්‍යාපෘතිය සඳහා සභාවේ JCB යන්ත්‍ර ප්‍රජාමූල සංවිධාන 02 ක් වෙත ලබාදී තිබූ අතර, එම යන්ත්‍ර කුලියට ලබාදීමේදී මීටර් පැයක් සඳහා රු.6,500 ක් බැගින් මීටර් පැය 130.9 ක් සඳහා කුලී මුදල් අය නොකිරීම නිසා සභා අරමුදලට රු.305,546 ක පාඩුවක් සිදුවී තිබුණි. | මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ තීරණය මත ඉන්ධන වියදම පමණක් අයකර ගත් බව. | සභා අරමුදලට සිදුව ඇති පාඩුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 129 ක් හා 122 ක් වූයෙන් තනතුරු 02 කට අදාළ අතිරික්තතා 07 ක් විධිමත්කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කරන බව. | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4:2:3, 4.5 හා 4.6 ඡේද සහ 2019 ජුනි 27 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 05/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සභාවේ සේවය කර මියගිය හා සේවය හැරගිය සේවකයින් 06 දෙනෙකුගෙන් ලැබිය යුතු සේවක ණය රු.169,749 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක් නිලධාරියෙකුගෙන් රු.5,000 ක් අයවී ඇති බවත්, තවත් නිලධාරියෙකු රු.2,000 බැගින් වාරික වශයෙන් ගෙවන බවත්, අනෙක් නිලධාරීන්ගේ ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවේ සේවයේ නියුතු කම්කරුවන් 07 දෙනෙකුට තනතුරට හිමි අනුමත රාජකාරියෙන් බැහැරව වෙනත් රාජකාරී පවරා තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,290,785 ක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි. | සේවා අවශ්‍යතාවය අනුව වෙනත් රාජකාරි කටයුතු පවරා ඇති බව. | සේවකයින් ඔවුන්ට නියමිත රාජකාරීවල යෙදවිය යුතුය. |